**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහන - 2 ව්‍යාපෘතිය - 2017**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V පරිච්ඡේදය හා 2014 ජුනි 03 දින එළඹි අංක 3029-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ 3030 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් හෙවත් ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 59.3 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 කට සමාන එජඩො මිලියන 18 ක් හෙවත් ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 15.3 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් හෙවත් සියයට 25.4 ක් ශ්‍රී ලංකා රජයේ දායකයෙන් අපේක්ෂා කර තිබුණි. තවද ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එජඩො මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එජඩො මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර

ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතියේ කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක සහ අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**--------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** <u>**මතය**</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කල අගය මත බදු ගෙවීම් එකතුව රු. මිලියන 182.41 ක මුදල කෙරිගෙන යන වැඩ යටතේ ගිණුම් වල දක්වනවා වෙනුවට රජයෙන් ලද දායක මුදලට හිලව් කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ණය ලෙස ලැබුණු මුදලින් පොළිය හා බැදීම් ගාස්තු ලෙස අය කරගත් මුදල එ.ජ.ඩො.මිලියන 0.44 කට සමාන වූ රු. මිලියන 67.29 ක් වූ අතර එය අවසන් ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ණය ප්‍රදාන ආයතනයේ අරමුදල් වියපැහැදම් ලේඛණයට අනුව 2017 නොවැම්බර් හා දෙසැම්බර් මාසයන් තුලදි එකතුව එ.ජ.ඩො 108,553 කට සමාන රු. මිලියන 16.68 ක වියදමක් ණය ප්‍රදාන ආයතනය විසින් දරා තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය විසින් එම වියදම හදුනාගෙන ගිණුම් වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 නීති රීති, රෙගුලාසි වලට අනුකල නොවීම

-----------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තියට පටහැනිව, කොළඹ නගරයේ දකුණු හා බටහිර ප්‍රදේශ වල ආදායම් නොලබන ජල හානිය පුනරුත්ථාපන පද්ධතියන්ට අදාල කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අත්සන් කිරීම වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කර තිබුණි.

## 3 මූල්‍ය හා භෞතික කාර්යය සාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛණ කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආ.ස.බැ | 88 | 11,440 | 79.95 | 10,394 | 1,446.20 | 9.38 | 1,453.89 | 16.49 | 2,512.59 |
| ශ්‍රී.ලං.ර | 30 | 3,900 | 27.10 | 3,523 | 450.40 | 2.68 | 416.61 | 3.47 | 535.24 |
| එකතුව | **118** | **15,340** | **107.05** | **13,917** | **1896.60** | **12.06** | **1870.05** | **19.96** | **3,047.83** |

ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කර වර්ෂ 03 යි මාස 04 ක් ගත විමෙන් පසු රු. මිලියන 10,334 කට සමාන එ.ජ.ඩො. මිලියන 79.95 ක මුළු වෙන්කිරීම් තුලින් 2017 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය රු. මිලියන 2,512.59 කට සමාන එ.ජ.ඩො. මිලියන 16.49 ක් පමණක් විය. තවද ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක සැලසුමක් නොවීම හේතුවෙන් නිශ්චිත ව්‍යාපෘති කාලය තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කර ගැනීම සැක සහිත බව නිරීක්ෂණය විය.

**3.2 භෞතික කාර්යය සාධනය**

**----------------------------**

ව්‍යාපෘති ලේඛනයට අනුව ව්‍යාපෘති සංරචක 13 ක් වූ ප්‍රගති වාර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට එම සංරචකයන්හි සමස්ත භෞතික ප්‍රගතිය කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යය සාධනය හා කොන්ත්‍රාත් කළමනාකරණයේ දුර්වලතා ආදිය හේතුවෙන් පැවතියේ සියයට 5.61 ක ප්‍රතිශතයක් පමණි. තවද, පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා, රජයට හිමි බද්ධ නිවාසවල නල පද්ධති පුනරුත්ථාපනය සහ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය මධ්‍යම බටහිර සඳහා කොටස් 02 කින් යුත් මෙහෙයුම් උපකරණ ප්‍රසම්පාදනය යන කොන්ත්‍රාත්තුවන් 2018 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රදානය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති සංරචකයන් යටතේ ප්‍රදානය කළ කොළඹ නගරයේ බටහිර හා දකුණු ප්‍රදේශයන්හි ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව හා ප්‍රජා සහභාගිත්ව පිළිබඳ දැනුවත් කිරීම හා හැසිරීම් වෙනස්වීම පිළිබඳ උපදේශන සේවා යන කොන්ත්‍රාත්තුවන්හි නිම කිරීම් දිනයන් ව්‍යාපෘති කාර්යන් නිම කිරීමට සැලසුම් කර තිබූ 2019 ජූනි 30 දිනෙන් ඔබ්බට තිරණ කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පූර්ව ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුවක් ලෙසට ණය ප්‍රදාන ආයතනය විසින් අනුමත කර තිබුණද කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 504 ක් ගත කර තිබුණු බවට නිරීක්ෂණය විය. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නල මාර්ග දිගේ මිනුම් මත පදනම් වූ තාත්වික ඇස්තමේන්තු මුල්අදියරේදී සකස් කර නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ නගරයේ බටහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු කල කිලෝමීටර් 99 ක දුර ප්‍රමාණය පසුව කිලෝමීටර් 194.5 ක් දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් ලංසු ලේඛණයට අනුව ලංසු ඉදිරිපත් කිරීමට ඉඩ දුන් අවසන් දිනය වන විට තෝරාගත් ලංසුකරු විසින් යොදාගනු ලබන ද්‍රව්‍ය සඳහා වූ නිෂ්පාදන අනුකූලතා සහතිකයන් හා ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන් පිළිබඳ විස්තර කොන්ත්‍රාත් ඇගයීම් කාර්යය සඳහා ඉදිරිපත් කළ යුතු විය. එහෙත් කොළඹ නගරයේ බටහිර ප්‍රදේශය සඳහා වූ ආදයම් නොලබන ජලය අඩු කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපන සංරචකයෙහි කොන්ත්‍රාත් ගිවිසුම 2016 දෙසැම්බර් 01 දින අත්සන් කලද ලංසුකරු විසින් අදාල එම සහතික ගිවිසුම අත්සන් කල දින දක්වා ලබාදීමට කටයුතු කර නොතිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් ප්‍රදානයෙන් මාස 13 ක් ඉක්ම ගියද එම කොන්ත්‍රාත් කාර්යයන්හි භෞතික කාර්යය සාධනය සියයට 9.57 ක් වැනි වූ අඩු ප්‍රතිශතයක් විය. මීට අමතරව ඉහත කොන්ත්‍රාත්තුව තුල වූ දිස්ත්‍රික් මීනුම් ප්‍රදේශ 18 ක හා පෝෂක නල මාර්ග 02ක ජල පීඩනය පදනම් කරගෙන නළ මාර්ග සැලසුම් කිරිම යටතේ වූ මූලික සැලසුම් 2018 මාර්තු 30 වන දින තෙක්ම නිම කර නොතිබුණි.

(ඈ) කොළඹ දකුණ ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහාවූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 10 දින ප්‍රදානය කළද ඒ යටතේ වූ පෝෂක නල මාර්ග පද්ධතියේ හා දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශ 09 ක් සඳහා දළ සැලැස්මක් සකස් කිරීමේ කාර්යයන් 2018 මාර්තු 30 දින වන තෙක්ම නිම කර නොතිබුණි. තවද මිනුම් කටයුතු සඳහා ඉලක්කගත නිවාස 35,000 න් 2017 දෙසැම්බර් 31 දින වනවිට මිනුම් කටයුතු අවසන් කල නිවාස සංඛ්‍යාව 15,894 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 දෙසැම්බර් 31 දිනට පෙර නිම කිරීමට බලාපොරොත්තු වූ කිලෝමීටර්

155 ක නල මර්ග ඇතිරීම් ප්‍රමාණයෙන් නිම කිරීමට හැකි වූ ප්‍රමාණය කිලෝමීටර් 02 ක් පමණක් විය.

(ඉ) ප්‍රජා ධාරිතා වර්ධන සංරචකය යටතේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 65 ක් තුල දැනුවත් කිරීමේ හා හැසිරීම් සම්බන්ධ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා වූ ගිවිසුමට 2016 ජුනි 30 දින රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ එළඹ තිබුණි. කෙසේ වුවද එම දැනුවත් කිරීමේ වැඩ සටහන් 2017 ජුලි මස දී ආරම්භ කලද 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ඊ) ජල භාවිතා කරන්නන් සඳහා වූ මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සම්බන්ධ ප්‍රගති වාර්තා පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ජල භාවිතා කරන්නන් සඳහා පවත්වන ලද වැඩ සටහන් සංඛ්‍යාව පමණක් අඩංගුවීම නිරික්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දින වනවිට එක් එක් පැකේජයන් යටතේ පවත්වන ලද වැඩ සටහන් පිළිබඳ විස්තර, හඳුනාගත් විසඳිය යුතු කරුණු ආදිය සඳහා නිර්දේශයන් හා විසඳුම් යනාදිය එහි සඳහන් නොවුණු අතර දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහාභාගි වීමෙන් පසුව ජල භාවිතා කරන්නන්ගේ වෙනස් වීමේ රටාවන් මැනීම සඳහා වූ නිශ්චිත ක්‍රමවේදයක්ද ස්ථාපිත කර නොතිබුණි.

### 3.4 මත භේදයට තුඩු දෙන කරුණු

පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා බදු පදනම යටතේ 2015 සැප්තැම්බර් 02 දින පවරා ගැනිමට කටයුතු කල ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම 2017 අගෝස්තු මස තුලදී ඒ සඳහා ගෙවීම් කරන ලද රු.මිලියන 10 ක් වූ අත්තිකාරම් මුදලද අයකර ගැනිමට කටයුතු කර ගැනිමකින් තොරව කොළඹ මහා නගර සභාව වෙත පවරා තිබුණි. මීට අමතරව අදාල ඉඩම පවරා තිබීම හේතුවෙන් කාර්යාල ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ සැලසුම් සඳහා ගෙවීම් කරන ලද රු.මිලියන 2.11 ඵල රහිත වියදමක් වී තිබුණි.

### 3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ නියමය පරිදි ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3.2 කොටසේ අවශ්‍යතාවයට පටහැනිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය විසින් වැඩ බැලීමේ පදනම මත ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුර (නැගෙනහිර පළාත) සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකව පත්කර තිබුණි.